# (29) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

I පත්‍රය :- **කාලය පැය 02යි.**
වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න **50**කි. ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතු ය.
එක් ප්‍රශ්නයකට ලකුණු **01** බැගින් ලකුණු **50**කි.

II පත්‍රය :- **කාලය පැය 03යි.** (ඊට අමතරව කියවීමේ කාලය මිනිත්තු 10යි.)
ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **හතකි. ප්‍රශ්න පහකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **40** බැගින් ලකුණු **200**කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු = $05 \times 40 = 200$

අවසාන ලකුණ ගණනය කිරීම :-

| | | | |
|---|---|---|---|
| I පත්‍රය | | = | 50 |
| II පත්‍රය | = 200 ÷ 4 | = | 50 |
| අවසාන ලකුණ | | = | 100 |

## I පත්‍රය

01. සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර භූමිකාව එකිනෙක හුවමාරු වන ආකාරය දක්වන ආකෘතිය කුමක් ද?
(1) හැරල්ඩ් ඩී. ලැස්වෙල් (2) ශ්‍රාම්-ඔස්ගුඩ් (3) HUB
(4) ඇරිස්ටෝටල් (5) ෂැනොන් වීවර්

02. ''සන්නිවේදනය කිසිවිටෙකත් හුදකලා ව නොපවතින වෙනස් වන දෙයකි.'' මෙම ප්‍රකාශයෙන් ගම්‍ය වන්නේ, සන්නිවේදනය,
(1) ඒකමාර්ගික මෙන්ම ද්විමාර්ගික වන බව ය. (2) බලයක් වන බවය.
(3) ක්‍රියාපටිපාටියක් වන බවය. (4) සන්දර්භානුගත වන බවය.
(5) සංකේතාත්මක වන බවය.

03. මූලාශ්‍රය පැහැදිලිව හඳුනාගත **නොහැකි** සන්නිවේදන ස්වරූපය වන්නේ,
(1) වාචික සන්නිවේදනයයි. (2) විධිමත් සන්නිවේදනයයි.
(3) අවිධිමත් සන්නිවේදනයයි. (4) නිර්වාචික සන්නිවේදනයයි.
(5) කථන සන්නිවේදනයයි.

04. ගුරුවරයා පන්ති කාමරයට පැමිණ පාඩම් පොත පෙරළන විටම පාරේ ගිය වාහනයකින් නිකුත් වූ සයිරන් නලා හඬ නිසා ළමයි එකිනෙකාගේ මුහුණු බලා ගත්හ. මෙම සමස්ත සිදුවීම් මාලාව තුළ මුඛ්‍ය වශයෙන් දක්නට ලැබෙන්නේ
(1) අවිධිමත් සන්නිවේදනයකි. (2) සන්නිවේදන බාධකයකි.
(3) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයකි. (4) නිර්වාචික සන්නිවේදනයකි.
(5) ශබ්ද සන්නිවේදනයකි.

05. පාසල් ක්‍රීඩා පිටියේ දී ක්ලාන්ත වූ සිසුවෙකුට ප්‍රථමාධාර ලබාදුන් ශිෂ්‍ය නායකයෙකු සඳහන් කළේ තමා පොත් කියවීමෙන් ලැබූ අවබෝධය හා ප්‍රථමාධාර දෙන ආකාරය නිරීක්ෂණය කර තිබීම ඒ සඳහා උපකාරී වූ බවකි. මෙම කරුණ අයත් වන සන්නිවේදන මූලිකාංගය වන්නේ,
(1) ආකේතකරණයයි. (2) විකේතකරණයයි. (3) ප්‍රතිපෝෂණයයි.
(4) අත්දැකීම් පසුතලයයි. (5) සන්දේශ ප්‍රතිග්‍රහණයයි.

06. එක ම දිනක එක ම වේලාවක දීප ව්‍යාප්ත රුක් රෝපණ වැඩසටහනක් පැවැත්වීම සඳහා ජනතාව දැනුවත් කිරීමට භාවිත කළ හැකි සාර්ථක සන්නිවේදන වර්ගය කුමක් ද?
(1) අතථ්‍ය සන්නිවේදනය (2) අන්තර් පුද්ගල සන්නිවේදනය
(3) සමූහ සන්නිවේදනය (4) මහජන සන්නිවේදනය
(5) ජනසන්නිවේදනය

07. ''තනි ලෝක සංස්කෘතියක්'' නිර්මාණය කිරීම සඳහා ක්‍රියාත්මක සංකල්පය වන්නේ,
(1) වාණිජකරණයයි. (2) මාධ්‍ය අභිසාරිතාවයි.
(3) භාණ්ඩකරණයයි. (4) ගෝලීයකරණයයි.
(5) නිර්මහාපරිමාණකරණයයි.

08. සිනමා හා ටෙලි නාට්‍ය නිර්මාණ කාර්යයක පදනම වන්නේ,
(1) මූලාශ්‍රයයි. (2) තිර පිටපතයි. (3) රංගනයයි.
(4) අධ්‍යක්ෂණයයි. (5) වේශ නිරූපණයයි.

09. සමාජ දැනුම ලබාදීම මෙන්ම විවිධ අවස්ථාවල දී හැසිරිය යුතු ආකාරය පිළිබඳ දැනුවත් කිරීමේ මාධ්‍ය මෙහෙවර අදාළ වන්නේ,
(1) ස්ව-සංකල්පයටයි. (2) නිරීක්ෂණයටයි.
(3) සමාජානුයෝජනයටයි. (4) සංජානනයටයි.
(5) සාක්ෂරතාවටයි.

10. මානව සන්නිවේදනයේදී සිතුවිලි, කේත ආශ්‍රයෙන් සන්දේශ බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය හඳුන්වන්නේ,
(1) ප්‍රතිපෝෂණය ලෙසයි. (3) ආකේතකරණය ලෙසයි. (2) විකේතකරණය ලෙසයි.
(5) විස්තාරණය ලෙසයි. (4) අභිසරණය ලෙසයි.

11. ජනමාධ්‍ය ආයතන ඇතැම් කරුණු සම්බන්ධයෙන් වැඩි අවධාරිත බලයක් යොදයි. මෙය HUB ආකෘතියෙන් පෙන්නුම් කරනුයේ,
(1) පෙරහනු මගිනි. (2) බලපෑම මගිනි.
(3) මාධ්‍ය විස්තාරණය මගිනි. (4) ප්‍රතිපෝෂණය මගිනි.
(5) දොරටුපාලක මගිනි.

12. සංවර්ධනය සඳහා සන්නිවේදනය භාවිතයේ දී අදාළ **නොවන** ප්‍රකාශය කුමක් ද?
(1) සංවාද සක්‍රීය වූවකි. (2) ඒක මාර්ගිකව සන්නිවේදනය සිදු වේ.
(3) පුළුල් පරාසයක මෙවලම් හා ක්‍රම භාවිත කරයි. (4) තීරණ ගැනීමේ දී ප්‍රජාව සහභාගි වේ.
(5) සංවාද, වාද විවාද යනාදිය මත පදනම් වේ.

13. සන්නිවේදනය හා සම්බන්ධ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
**A** - සහවේදනය **B** - විෂමජාතීය ග්‍රාහකයින් **C** - ස්ව-සංකල්පය **D** - ප්‍රදීපාගාර ක්‍රමය
ඉහත ලක්ෂණ අදාළවන සන්නිවේදන වර්ග පිළිවෙළින්,
(1) අන්තර්වර්ති, ජන, අන්තර් පුද්ගල හා සමූහ සන්නිවේදනය වේ.
(2) අන්තර්වර්ති, අන්තර් පුද්ගල, සමූහ හා ජන සන්නිවේදනය වේ.
(3) අන්තර් පුද්ගල, ජන, අන්තර්වර්ති හා සමූහ සන්නිවේදනය වේ.
(4) සමූහ, අන්තර් පුද්ගල, අන්තර්වර්ති හා ජන සන්නිවේදනය වේ.
(5) ජන, සමූහ, අන්තර්වර්ති හා අන්තර් පුද්ගල සන්නිවේදනය වේ.

14. ඇරිස්ටෝටල් හා හැරල්ඩ් ඩී. ලැස්වෙල් ආකෘති අතර අසමානතාව පෙන්නුම් කරන ප්‍රකාශය කුමක් ද?
(1) සන්නිවේදකයා, සන්දේශය හා ග්‍රාහකයා ඇතුළත් වේ. (2) ඒක මාර්ගික සන්නිවේදන ආකෘති වේ.
(3) ජන සන්නිවේදන ක්‍රියාවලිය විවරණය වේ. (4) ප්‍රතිපෝෂණය හා බාධක සඳහන් නොවේ.
(5) බලපෑම කෙරෙහි අවධානයක් යොමු කර තිබේ.

15. ආයතනයක මාධ්‍ය නිලධාරියාගේ කාර්යභාරයට **අවම** සම්බන්ධතාවක් දක්වන්නේ,
(1) ආයතනයේ විමර්ශන කටයුතුවලට පිළිතුරු ලබා දීමයි. (2) ඇගයීම් වාර්තා සකස් කිරීමයි.
(3) ප්‍රවර්ධන වැඩසටහන් මෙහෙය වීමයි. (4) මූල්‍ය කළමනාකරණයට උපදෙස් දීමයි.
(5) කීර්තිනාමය පිළිබඳ අවධානයයි.

16. කොරෝනා වසංගතය පිළිබඳ තොරතුරු පදනම් කරගෙන චීනයෙහි නිර්මාණය වූ වාර්තා චිත්‍රපටයක් ශ්‍රී ලංකාවේ ද එම රෝග ව්‍යාප්ත වූ ප්‍රදේශවල ප්‍රදර්ශනය කරන ලදී. මෙය වඩාත් වැදගත් වන්නේ,
(1) කොරෝනා පිළිබඳ පළමුව තොරතුරු වාර්තා වන්නේ චීනයෙන් වන බැවිනි.
(2) දෘශ්‍ය මාධ්‍ය වඩාත් ප්‍රබල වන බැවිනි.
(3) සමූහ සන්නිවේදන ක්‍රියාවක් වන බැවිනි.
(4) සමාන අත්දැකීම් ක්ෂේත්‍රයක් ගැන තොරතුරු ලැබෙන බැවිනි.
(5) අන්තර් සංස්කෘතික සම්බන්ධතා ගොඩ නැගෙන බැවිනි.

17. සන්නිවේදන සමීක්ෂණයක දී දත්ත රැස් කිරීම සඳහා යොදා ගත හැකි ප්‍රධාන ක්‍රමවේද දෙකක් වන්නේ,
(1) ප්‍රශ්නමාලා හා සම්මුඛ සාකච්ඡා ක්‍රමයි.
(2) සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ ක්‍රමයි.
(3) සහභාගීත්ව නිරීක්ෂණ හා ප්‍රශ්නමාලා ක්‍රමයි.
(4) බුද්ධි කලම්බනය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමයි.
(5) නිරීක්ෂණ හා සහභාගිත්ව නිරීක්ෂණ ක්‍රමයි.

18. එකම පන්තියක අධ්‍යාපනය ලැබූ මිතුරන් සමූහයක් විභාගය සමත් වීමෙන් පසු ශිෂ්‍යත්ව ලබා විදෙස්ගත වූහ. ඔවුහු නූතන සන්නිවේදන විධික්‍රම උපයෝගි කර ගනිමින් තොරතුරු හුවමාරු කර ගත්හ. එම තොරතුරු හුවමාරුව
A - යන්ත්‍ර සහායක, කණ්ඩායම් සන්නිවේදනයකි.
B - අතථ්‍ය, තාක්ෂණික සන්නිවේදනයකි.
C - යන්ත්‍ර සහායක, අතථ්‍ය සන්නිවේදනයකි.
D - යන්ත්‍ර සහායක, තාක්ෂණික සන්නිවේදනයකි.
ඉහත ප්‍රකාශ ඇසුරින් සත්‍ය වන්නේ,
(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය.
(4) C හා D ය. (5) A, B, C හා D ය.

19. මහාචාර්ය පිලිප් කොට්ලර් විසින් ඉදිරිපත් කරන ලද සිද්ධි වර්ගීකරණයට ඇතුළත් **නොවන්නේ,**
(1) සමාජ හා ජීවන චක්‍ර සිද්ධියයි.
(2) දේශපාලන සිද්ධියයි.
(3) අධ්‍යාපනික හා වෘත්තීය සිද්ධියයි.
(4) පාරිසරික සිද්ධියයි.
(5) ආගමික සිද්ධියයි.

20. ස්වයං-නියාමන ප්‍රතිපත්ති යටතට ගැනෙන නියාමන ආයතනය කුමක් ද?
(1) ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලය
(2) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
(3) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
(4) ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
(5) ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය

21. අන්තර්ජාලය ඔස්සේ විද්‍යුත් පුස්තකාලයකට ප්‍රවේශ වී තොරතුරු ලබා ගැනීමට ඔබට අවශ්‍යව ඇතැයි සිතන්න. මේ සඳහා අත්‍යාවශ්‍ය වන සාධකය කුමක්ද?
(1) දත්ත සංචිතය (Data base)
(2) අන්තර් ක්‍රියාකාරීත්වය (Interactivity)
(3) ස්වයංකරණය (Automation)
(4) ජාලගතකරණය (Networking)
(5) වේගවත් සංදේශකරණය (Fastest Messaging)

22. සංස්කෘතිය යනු,
A - මානව අත්දැකීම්, පුරුදු හා හැකියා ඇතුළු සමස්තයයි.
B - ජනමාධ්‍ය මගින් උගන්වනු ලබන ඇගයුම් සමූහයයි.
C - සමාජය එකට බැඳ තබන වටිනාකම්වලින් සමන්විත වූව කි.
D - මානව සබඳතා මත බිහි වී වර්ධනය වූව කි.

ඉහත කරුණුවලින් වඩාත් නිවැරදි වන්නේ,
(1) A හා B පමණි.
(2) A හා D පමණි.
(3) A, B හා C පමණි.
(4) A, C හා D පමණි.
(5) B, C හා D පමණි.


23. ඕනෑම ආයතනයකට හෝ සංවිධානයකට හෝ මහජන සම්බන්ධතා අත්‍යවශ්‍ය වන්නේ,
(1) ආයතයේ කීර්තිනාමය පවත්වා ගැනීමටයි.
(2) විධිමත් සන්නිවේදන ක්‍රමවේදයක් භාවිතයටයි.
(3) ආයතනයේ හෝ සංවිධානයේ ප්‍රතිලාභ ජනතාවට බෙදා දීමටයි.
(4) ආයතනයේ ලාභ වැඩිකර ගැනීමටයි.
(5) අන් ආයතන හා තරගකාරීත්වයක් ඇති කිරීමටයි.

24. සාම්ප්‍රදායික සන්නිවේදන විධික්‍රමයක් ලෙස ගැමි නාටක පිළිබඳ කියවෙන **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?
(1) අදෘශ්‍යමාන වස්තූන් ඇමතීම හා ඒවායෙන් පිහිටක් ලබා ගනී.
(2) ගැමි නාටක සඳහා කිසියම් කථා පුවතක් පදනම් කරගනී.
(3) ප්‍රදේශ අනුව ගැමි නාටකවල විවිධතා පවතී.
(4) කවි කීම, හිටිවන සංවාද උපයෝගී කරගනී.
(5) රංගයට අදාළ භාණ්ඩ පරිසරයෙන්ම සපයා ගනී.

25. 1982 දී යුනෙස්කෝ සංවිධානය ගෲන්වල්ට් ප්‍රකාශය මගින් මාධ්‍ය අධ්‍යයනය සඳහා නිර්දේශ කරන ලද්දේ,
(1) මාධ්‍ය සාක්ෂරතාව, විචාරශීලී ලෙස මාධ්‍ය පරිහරණය හා නිර්මාණශීලී චින්තනය දරුවන් තුළ ඇති කිරීමයි.
(2) ජන මාධ්‍ය ආයතනයන්හි ක්‍රියාකාරීත්වය පිළිබඳ ව පුද්ගලයෙකු තුළ අවබෝධය ගොඩ නැංවීමයි.
(3) සන්නිවේදන තාක්ෂණයේ දියුණුව සමාජය වෙත කරන බලපෑමේ ස්වභාවය පිළිබඳ ව දැනුවත් කිරීමයි.
(4) බිඳ වැටුණු මානසික තත්ත්වයන් ඉලක්ක කර ගනිමින් මාධ්‍ය ඔස්සේ සරල විනෝදය සම්පාදනය කිරීමයි.
(5) සංවර්ධනාත්මක හා ප්‍රජාතන්ත්‍රවාදී චින්තනයෙන් පෝෂණය වූ පුරවැසියකු නිර්මාණය කිරීමයි.

26. රියැලිටි වැඩසටහනක් පිළිබඳ ග්‍රාහක ප්‍රතිචාර කෙබඳු ද යන්න පිළිබඳ දැන ගැනීමට නිමල්ට අවශ්‍ය ව ඇත. ඒ සඳහා ඔහු මුලින් ම කළ යුතු වන්නේ,
(1) දත්ත රැස් කිරීම ය.
(2) දත්ත විශ්ලේෂණය කිරීම ය.
(3) අරමුණු හඳුනා ගැනීම ය.
(4) නියැදියක් තෝරා ගැනීම ය.
(5) දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය සැකසීම ය.

• අංක **27** සිට **28** දක්වා වූ ප්‍රශ්න සඳහා පහත දැක්වෙන රූප සටහන ඇසුරින් පිළිතුරු සපයන්න.




27. ඉහත රූපසටහනින් දැක්වෙන්නේ සන්නිවේදන ආකෘතියක අන්තර්ගත කරුණුය. එහි A, B හා C වලට අයත් කරුණු පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?
(1) ආකේතකරය, විකේතකරය, ප්‍රතිපෝෂණය
(2) සන්නිවේදකයා, පණිවිඩය, නාලිය
(3) විකේතකරය, ප්‍රතිපෝෂණය, සන්නිවේදකයා
(4) ආකේතකරය, ග්‍රාහකයා, පණිවිඩය
(5) ආකේතකරය, පණිවිඩය, විකේතකරය

28. ඉහත දැක්වෙන රූප සටහන අනුව A, B හා C අතර සිදුවන ක්‍රියාවලිය හේතුවෙන්,
J - රේඛීය සන්නිවේදනයක් සිදුවන බව දක්නට ලැබෙයි.
K - ප්‍රතිපෝෂණය සිදුවන බව පැහැදිලි ය.
L - බාධාවක් සිදුවී ඇත්දැයි හඳුනාගත හැකි ය.
M - සංදේශය වටහාගත් ආකාරය පැහැදිලි ය.

මෙම ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ,
(1) J හා M පමණි.
(2) K හා L පමණි.
(3) L හා M පමණි.
(4) J, K හා L පමණි.
(5) K, L හා M පමණි.

29. සිනමා කෘතියක් ප්‍රදර්ශනයට පෙර නියාමනය සිදු කරන්නේ,
(1) ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලයයි.
(2) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවයි.
(3) සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයයි.
(4) ජාතික චිත්‍රපට සංස්ථාවයි.
(5) ජන මාධ්‍ය අමාත්‍යාංශයයි.

30. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) (අ) මගින්, සෑම පුද්ගලයෙකුගේ ම
A - තොරතුරු ඇගයීමේ හිමිකම තහවුරු කරයි.
B - භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට ඇති හිමිකම තහවුරු කරයි.
C - තොරතුරු දැරීමේ අයිතිය ප්‍රකාශිතව දක්වයි.
D - ප්‍රකාශන හිමිකම තහවුරු කරයි.
E - මාධ්‍ය නිදහස ප්‍රකාශ වේ.
ඉහත ප්‍රකාශන අතුරින්, සත්‍ය වන්නේ,
(1) A පමණි.
(2) B පමණි.
(3) C පමණි.
(4) A, B හා C පමණි.
(5) C, D හා E පමණි.

31. බස් රථයක ගමන් කරමින් සිටි රවීට අසල අසුනේ සිටි තැනැත්තා අසන ප්‍රශ්නවලට පිළිතුරු දීම මහත් කරදරයක් විය. තම ජංගම දුරකතනයට කන්බණුව (earphone) සම්බන්ධ කළ රවී ගුවන්විදුලි ගීතයකට සවන් දීමට පටන් ගත්තේ ය.
මෙය ජනසන්නිවේදනය සම්බන්ධ කවර කාර්යයක් ලෙස සැලකෙන්නේ ද?
(1) නිර්නියාමනය (Deregulation)
(2) සමාජානුයෝජනය (Socialization)
(3) සමාජ උපයෝගිතාව (Social Utility)
(4) නිෂ්කර්ෂණය (Withdrawal)
(5) අපසරණය (Divertion)

32. මහජන සම්බන්ධතා හා ඊට අදාළ කාර්යයක් බැගින් දැක්වෙන ප්‍රකාශ යුගල කිහිපයක් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| A i. | මාධ්‍ය මහජන සම්බන්ධතා | B i. | වෘත්තීය මහජන සම්බන්ධතා |
| ii. | බලපත්‍ර ලබා දීම | ii. | පර්යේෂණ හා දැනුම |
| C i. | ආයතනික මහජන සම්බන්ධතා | D i. | රාජ්‍ය මහජන සම්බන්ධතා |
| ii. | රාජ්‍ය සම්බන්ධතා | ii. | ආචාරධර්ම පද්ධති |

ඉහත ඒවා අතුරෙන් වඩාත් සමීප සම්බන්ධතාවක් දැක්වෙන යුගල ඇතුළත් වරණය වන්නේ,

(1) A හා B ය. (2) B හා C ය.
(3) A, B හා C ය. (4) B, C හා D ය.
(5) A, B, C හා D යන සියල්ලම ය.

33. මාධ්‍ය භාෂා භාවිතය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) මාධ්‍යයක භාවිත භාෂාව මගින් ග්‍රාහක ස්ථානයේ භාවාත්මක පදනම වර්ධනය කළ හැකි ය.
(2) ඇතැම් විටෙක මාධ්‍යයක භාවිත භාෂාව මගින් ග්‍රාහකයන් අතරමං කරනු ලබයි.
(3) වාචික භාෂාවේ බහුලත්වය දෘශ්‍ය මාධ්‍ය අපේක්ෂා තීව්‍ර කරයි.
(4) නව මාධ්‍යයන්හි භාවිත භාෂාව මුද්‍රිත මාධ්‍ය භාෂාව තරම් ප්‍රමිති ගුණයෙන් යුක්ත නොවේ.
(5) ගුවන්විදුලි මාධ්‍ය තුළ විස්තරාත්මක වැකිවලින් වැළකීම යෝග්‍ය වේ.

34. සන්නිවේදන ක්‍රියාදාමයේ දී ''නිර්නියාමනය'' පිළිබඳ ගැළපෙන ප්‍රකාශය තෝරන්න.

(1) පුවත්පත් මුද්‍රණ කඩදාසි සඳහා බදු පැනවීම
(2) පුවත්පත් ලියාපදිංචිය අනිවාර්ය කිරීම
(3) රූපවාහිනී නාලිකා අතර තරගය අහෝසි කිරීම
(4) ප්‍රවෘත්ති වෙබ් බලපත්‍රය යාවත්කාලීන කිරීම
(5) මාධ්‍ය ආයතනවලට ලාභ ලැබීමට අවස්ථාවන් ලබා දීම

35. පහත වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| | X | Y |
|---|---|---|
| A | ස්වයං නිර්ණය | පුද්ගල ස්වාධීනත්වය |
| B | මාධ්‍ය පරිභෝජනය | ග්‍රාහක දර්ශකය |
| C | අවශ්‍යතා කේන්ද්‍රීයත්වය | සෞඛ්‍ය සේවා |
| D | නිර්මහාපරිමාණකරණය | පුළුල් ග්‍රාහක සමාජය |

ඉහත වගුවෙහි X හි තහවුරු වීම Y හි වැඩිවීම කෙරෙහි බලපාන්නේ,

(1) A හා B හි දී ය. (2) A හා C හි දී ය. (3) B හා C හි දී ය.
(4) B හා D හි දී ය. (5) C හා D හි දී ය.

36. රූපවාහිනියේ ටෙලිනාට්‍යයක් විකාශය වීමෙන් පසු කිසියම් ව්‍යාපාරිකයෙකු විසින් එය හොර රහසේ පටිගත කොට විකුණූ බවට හෙළිවිණි. එය දඬුවම් ලබන වරදක් බව පැහැදිලි ලෙස හඳුන්වා ඇත්තේ,

(1) තොරතුරු දැන ගැනීමේ පනත තුළ ය.
(2) බුද්ධිමය දේපළ පනත තුළ ය.
(3) මානව හිමිකම් ප්‍රකාශනය තුළ ය.
(4) රූපවාහිනි සංස්ථා පනත තුළ ය.
(5) චිත්‍රපට සංස්ථා පනත තුළ ය.

37. මාර්ගගත දත්ත පද්ධතියක් මගින් විවිධ තොරතුරු මූලයන්ට ප්‍රවේශ වීමට ඇති හැකියාව හඳුන්වන යෙදුම කුමක් ද?

(1) අංකිතකරණය (Digitalisation) (2) ජාලගතකරණය (Networking)
(3) අන්තර් ක්‍රියාකාරීත්වය (Interactivity) (4) අධිපාඨනීයත්වය (Hypertexuality)
(5) ස්වයංකරණය (Automation)

- පන්තියක සිසුන්ගේ මාධ්‍ය භාවිතය පිළිබඳ සිදු කළ සමීක්ෂණයකදී ලද දත්ත සමූහයක් පහත වගුවේ දැක්වේ.

| | ජනමාධ්‍ය පමණි | සමාජ මාධ්‍ය පමණි | ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය |
|---|---|---|---|
| පිරිමි | 10 | 20 | 30 |
| ගැහැණු | 08 | 12 | 20 |

38. ඉහත දත්ත සටහනට අනුව පිරිමි සිසුන්ගේ මාධ්‍ය භාවිතය පිළිබඳ මාතය හා මධ්‍යස්ථ අගය වන්නේ පිළිවෙළින්,
(1) 10 හා 20 යි.
(2) 20 හා 10 යි.
(3) 20 හා 30 යි.
(4) 30 හා 10 යි.
(5) 30 හා 20 යි.

39. පිරිමි හා ගැහැණු ළමුන් ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය යන දෙකම භාවිත කිරීමේ ප්‍රතිශත පිළිවෙළින්,
(1) 20%, 30%
(2) 30%, 20%
(3) 30%, 60%
(4) 40%, 60%
(5) 60%, 40%

40. ගුවන් විදුලිය හඬ පදනම් කරගත් මාධ්‍යයකි. එහි මිනිස් හඬ හා සංකලනය වන සෙසු අංග වන්නේ,
(1) සංගීතය, සතුන්ගේ ශබ්ද, ශබ්ද ප්‍රයෝග හා නිහඬතාවයි.
(2) සංගීතය, නිහඬතාව, සතුන්ගේ ශබ්ද හා ස්වභාවික ශබ්දයි.
(3) ස්වාභාවික ශබ්ද, අනුකරණාත්මක ශබ්ද, ශබ්ද ප්‍රයෝග හා නිහඬතාවයි.
(4) අනුකරණාත්මක ශබ්ද, සංගීතය, නිහඬතාව හා ශබ්ද ප්‍රයෝගයි.
(5) ස්වාභාවික ශබ්ද, ශබ්ද ප්‍රයෝග, සංගීතය හා නිහඬතාවයි.

41. ''මාධ්‍ය සමීක්ෂණය'' යනු
(1) මාධ්‍ය පිළිබඳ ග්‍රාහක ප්‍රතිචාර කෙබඳු ද යන්න විමසීමයි.
(2) කුමන හෝ දැනුම් ක්ෂේත්‍රයක් පිළිබඳ ව ඉතා සැලකිල්ලෙන් සොයා බැලීම හෝ විමසීමයි.
(3) ග්‍රාහකයා කෙරෙහි ඇති කරන බලපෑම කවරාකාර දැයි විමසීමයි.
(4) සන්දේශය, සන්නිවේදකයා, නාලිකාව, ග්‍රාහකයා හා බලපෑම යනාදියෙහි තත්ත්වයන් පිළිබඳ යෝජනා ලබා ගැනීමයි.
(5) මාධ්‍යයේ නව ප්‍රවණතා, අන්තර්ගතය හා සන්දේශකරණ පිළිබඳ විමසා බැලීමයි.

42. ගෝලීය සංස්කෘතිය පිළිබඳ ව අන්තර්ජාලය ඇසුරින් ලබාගත් තොරතුරු සිසුන් විසින් පන්තියට ඉදිරිපත් කරනු ලැබී ය.
සාමා : සන්නිවේදන තාක්ෂණයේ ශීඝ්‍ර දියුණුව සමඟ විවිධ රාජ්‍යවල ජාතික සංස්කෘතීන් සමීප කර තිබේ.
අමර : ගෝලීය සංස්කෘතිය සම්ප්‍රදායික ජන හා ජාතික සංස්කෘතික ප්‍රභේදවලට එකඟ වෙයි.
කුමාර් : සියලු ජාතීන්, සංස්කෘතීන් ඒකාකාරී වීම, සමජාතිය ගෝලීය ගැටලුවකි.
දේවී : ගෝලීය සංස්කෘතිය ලොව ජාතික වාර්ගික සංස්කෘතීන් විනාශ කරන්නකි.
මේ අතුරින් නිවැරදි ප්‍රකාශය ඉදිරිපත් කරන්නේ,
(1) සාමා, අමර හා දේවී ය.
(2) සාමා, අමර හා කුමාර් ය.
(3) සාමා, කුමාර් හා දේවී ය.
(4) අමර, කුමාර් හා දේවී ය.
(5) අමර, සාමා හා දේවී ය.

43. තමන්ගේ පාසල පිළිබඳ ව නිර්මාණය වන වාර්තා චිත්‍රපටියක් රූපගත කිරීම සඳහා රූපරාමු සැලසුම් කරන ආකාරය ගැන සිසුන් අතර සාකච්ඡාවක දී පහත සඳහන් කරුණු ඉදිරිපත් විය.
A - මුළු පාසලම දිස්වන පරිදි පාසැල් ඉදිරි පෙනුම රූපගත කළ යුතු ය.
B - පන්ති කාමරයේ පාඩම් උගන්වන ගුරුවරයාගේ රූපය පන්තිකාමරයේ පසුබිම සහිතව දැක්විය යුතු ය.
C - විදුහල්පතිතුමාගේ ඉදිරිපත් කිරීමේ දී ඔහුගේ මුහුණේ ඉරියව් පැහැදිලි ව දිස්විය යුතු ය.
D - චිත්‍රපටයේ අවසන් දර්ශනය පාසලේ ලාංඡනය දැක්විය යුතු ය.

ඉහත අවස්ථා රූපගත කිරීමේ දී වඩාත් ම උචිත රූපරාමු අනුපිළිවෙළ වන්නේ,
(1) දුර රූපය, මධ්‍යම රූපය, අතිදුර රූපය, සමීප රූපය
(2) දුර රූපය, සමීප රූපය, මධ්‍යම රූපය, අතිදුර රූපය
(3) අතිදුර රූපය, මධ්‍යම රූපය, දුර රූපය, සමීප රූපය
(4) අතිදුර රූපය, දුර රූපය, අති සමීප රූපය, සමීප රූපය
(5) ඉතා දුර රූපය, දුර රූපය, සමීප රූප, අති සමීප රූපය

44. සමීක්ෂණ ආචාරධර්ම පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.

A - දත්ත ලබා ගැනීමක දී සමීක්ෂකයාගේ බලය අයුතු ලෙස යොදා නොගැනීම.

B - ඕනෑම අවස්ථාවක දත්ත දායකයාට සමීක්ෂණ ක්‍රියාවලියෙන් ඉවත් වීමේ අවස්ථාව ලබා දීම.

මෙම ප්‍රකාශ ඇසුරෙන්,

(1) A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
(2) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.
(3) A හා B ප්‍රකාශ දෙකම අසත්‍ය වේ.
(4) A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වන අතර, A මගින් B තහවුරු කෙරේ.
(5) A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වන අතර B මගින් A තහවුරු කෙරේ.

45. පහත සඳහන් A, B, C, D සිද්ධි යුගල අධ්‍යයනය කර පිළිතුරු සපයන්න.

A - බුද්ධි කලම්බනය - ගැටලුව හඳුනා ගැනීම

B - අරමුණ හඳුනා ගැනීම - නිගමනවලට එළඹීම

C - දත්ත රැස්කිරීම - වාර්තාව ලිවීම

D - නිගමනවලට එළඹීම - වාර්තාව ලිවීම

එක් එක් යුගලයෙහි අන්තර්ගත කරුණු අතර වඩාත් සමීප සම්බන්ධතාවක් පෙන්නුම් කරන්නේ,

(1) A හා B වේ. (2) A හා C වේ. (3) A හා D වේ.
(4) B හා C වේ. (5) C හා D වේ.

46. විවිධ ආයතන පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| A : | ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය | 1 : | ජනාධිපතිවරයා විසින් සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබයි. |
| B : | ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම | 2 : | විෂයභාර ඇමතිවරයා විසින් සාමාජිකයන් පත් කරනු ලබයි. |
| C : | ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය | 3 : | විවිධ ක්ෂේත්‍රවල විද්වතුන්ගෙන් සමන්විත මණ්ඩලයකි. |
| D : | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව | 4 : | ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් නිල බලයෙන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි. |

මේ අතුරින් ආයතන හා නිලතල අතර නිවැරදි සම්බන්ධතාව පෙන්නුම් කරන වරණය තෝරන්න.

(1) A1, B2, C3, D4 (2) A2, B1, C3, D4 (3) A3, B2, C4, D1
(4) A1, B3, C2, D4 (5) A4, B3, C2, D1

47. පාසල් මාධ්‍ය ඒකකය මගින් පළකරන වාර සඟරා ලිපියක සඳහන් කරුණු කිහිපයක් පහත දැක්වේ.

A - විචාරශීලී මාධ්‍ය පරිහරණය
මාධ්‍ය ආචාරධර්ම පිළිබඳ අවබෝධය

B - මාධ්‍ය ප්‍රතිපත්ති කමිටුවක් පත් කිරීම
මාධ්‍ය නියාමනය

C - තොරතුරු පරිහරණය පිළිබඳ අවබෝධය
යහපත් පුරවැසියකු ලෙස සංවර්ධනයට දායක වීම

D - අවස්ථාවෝචිත භාෂා භාවිතය
නිර්මාණශීලී කුසලතා වර්ධනය

ඉහත කරුණු අතුරින් සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය හැදෑරීමේ අවශ්‍යතා පිළිබඳ අඩු වැදගත්කමක් සහිත වරණය වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) A හා C පමණි.
(4) B හා D පමණි. (5) C හා D පමණි.

48. ජනමාධ්‍ය ග්‍රාහකයින් පස් දෙනෙකුගේ මාධ්‍ය භාවිතය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

A - උදෑසන රූපවාහිනී පුවත්පත් කියවීම් නැරඹීමෙන් පසු නගරයට ගොස් පුවත්පතක් මිලදී ගනී.

B - ජංගම දුරකථනයෙන් උදෑසන ගුවන්විදුලි ප්‍රවෘත්ති විකාශනයට සවන් දී, ලැබී ඇති ප්‍රවෘත්ති කෙටි පණිවිඩ (News Alerts) කියවයි.

C - රාජකාරියට යන අතරතුර සුහුරු ජංගම දුරකථනය (Smart Phone) මගින් පුවත් වෙබ් අඩවිවලට සහ සමාජ මාධ්‍ය වෙත ප්‍රවේශ වෙයි.

D - රාත්‍රී නින්දට පෙර රූපවාහිනී ප්‍රවෘත්ති හා ගුවන්විදුලි ප්‍රවෘත්ති වෙබ් අඩවිවලින් නිරීක්ෂණය කොට පුවත්පත් වෙබ් අඩවි සමාජ මාධ්‍ය මගින් කියවයි.

E - Youtube මගින් චිත්‍රපටියක් නරඹා Facebook මගින් ඒ පිළිබඳ පලවන සංවාද කියවයි.

ඉහත ග්‍රාහකයින් අතුරින් මාධ්‍ය අභිසාරීතාව සමග වඩාත් සමීප වන ග්‍රාහක කාණ්ඩය වන්නේ,

(1) A, B, C හා E ය. (2) A, C, D හා E ය. (3) B, C, D හා E ය.
(4) B, D හා E ය. (5) C, D හා E ය.

49. ගැටුමක් නිරාකරණය කිරීම සඳහා ඔබට මැදිහත්වීමට සිදුවූයේ යැයි සිතන්න. එම ගැටුම තේරුම් ගැනීමෙන් අනතුරුව ඔබ විසින් ක්‍රියාත්මක කරනු ලබන වඩාත් සුදුසු ඊළඟ පියවර වන්නේ,

(1) ප්‍රතිපක්ෂ සමඟ සන්නිවේදනය කිරීමයි.
(2) හොඳම විසඳුම තෝරා ගැනීමයි.
(3) තෙවන පාර්ශවයක් මැදිහත්කර ගැනීමයි.
(4) යෝජනා ඉදිරිපත් කිරීමයි.
(5) ගැටුමට විකල්ප සොයා ගැනීමයි.

50. පහත සඳහන් ප්‍රකාශ සලකන්න.

| | | |
|---|---|---|
| A : | මැක්බ්‍රයිඩ් වාර්තාව | - රටක සන්නිවේදන ප්‍රතිපත්ති සකස් විය යුත්තේ අසමානතා දුරු කිරීමටයි. |
| B : | ෆෙඩරල් සන්නිවේදන කොමිෂන් සභාව | - යටත් විජිතවල ගුවන්විදුලි මාධ්‍ය හැසිරවීම පිළිබඳ ප්‍රතිපත්ති හඳුන්වා දී තිබේ. |
| C : | මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය | - තම මතය දැරීමේ හා ප්‍රකාශ කිරීමේ නිදහසට අයිතියක් ඇත. |

ඉහත ප්‍රකාශ අතුරින් ඍජු සම්බන්ධතාවක් දක්වන යුගලය/ යුගල ඇතුළත් වරණය වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.
(4) A හා C පමණි. (5) B හා C පමණි.

* *

## II පත්‍රය

01. (i) වාචික සන්නිවේදනයට අයත් කාර්ය **හතරක්** නම් කරන්න. **(ලකුණු 04යි.)**

(ii) (a) මහජන සන්නිවේදනයේ ප්‍රයෝජන **හතරක්** සඳහන් කරන්න. **(ලකුණු 04යි.)**

(b) ඉන් එකක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 04යි.)**

(iii) ඔස්ගුඩ් ශ්‍රාම් ආකෘතියේ සුවිශේෂතා **තුනක්** පැහැදිලි කරන්න. **(ලකුණු 12යි.)**

(iv) ජනමාධ්‍ය කාර්යභාරයට අයත් කරුණු **හතරක්** පදනම් කරගෙන ඒවා වර්තමාන ජනමාධ්‍යවල භාවිත කරන ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න. **(ලකුණු 16යි.)**

02. ඇමෙරිකාවේ සිට මහාචාර්ය විමල් දිසානායක පැවැත් වූ ''සන්නිවේදන මාධ්‍ය අධ්‍යයනය හා එහි ප්‍රවණතා'' යන දේශනයට අන්තර්ජාලය ඔස්සේ සජීවී ව සම්බන්ධ වීමට මෙරට සිසු දරුවන් පිරිසකට අවස්ථාව උදා විය.

(i) ඉහත දැක්වෙන අතථ්‍ය සන්නිවේදන වර්ගයට අයත් ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න. **(ලකුණු 04යි.)**

(ii) එම ලක්ෂණ අතුරෙන් **දෙකක්** ඉහත අවස්ථාවට අදාළව කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 08යි.)**

(iii) අධ්‍යාපනික කාර්යය සඳහා දෘශ්‍ය සන්නිවේදනය යොදාගත හැකි ආකාර **තුනක්** විස්තර කරන්න. **(ලකුණු 12යි.)**

(iv) ගෝලීයකරණය හේතුවෙන් මාධ්‍ය ක්ෂේත්‍රයෙහි සිදු වී ඇති නව ප්‍රවණතා **හතරක්** නිදර්ශන සහිතව සාකච්ඡා කරන්න. **(ලකුණු 16යි.)**

03. සමාජ ජාල මාධ්‍ය ඔස්සේ එක් රැස් වූ තරුණ තරුණියෝ රට ලස්සන කිරීමේ උදාර අරමුණින් සිතුවම් අඳිමින් නගරයේ තාප්ප අලංකාර කරති.

(i) සමාජ මාධ්‍ය යෙදවුම් (Apps) **දෙකක්** නම් කරන්න. **(ලකුණු 04යි.)**

(ii) නගර අලංකරණ සිතුවම් අතර නූතන සිතුවම් සේම සාම්ප්‍රදායික සිතුවම් ද දැකගත හැකි ය. එවැනි සාම්ප්‍රදායික සිතුවම් සඳහා භාවිත කළ හැකි ජනකලා **දෙකක්** නිදසුන් සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 08යි.)**

(iii) ගැමි ජීවන සාම්ප්‍රදායයේ රිද්මය ගැමි කවිය තුළ අන්තර්ගතව පවතී. ජන කවි තුළ දක්නට ලැබෙන සන්නිවේදන ලක්‍ෂණ **දෙකක්** විස්තර කරන්න. **(ලකුණු 12යි.)**

(iv) සමාජය හා සංස්කෘතිය කෙරෙහි ජනමාධ්‍යයට වඩා ප්‍රබල බලපෑමක් සමාජ මාධ්‍ය ඇති කරයි. පක්‍ෂව හෝ විපක්‍ෂව කරුණු හතරක් ඇසුරෙන් සාකච්ඡා කරන්න. **(ලකුණු 16යි.)**

04. ජන මාධ්‍ය පිළිබඳ අධ්‍යයනයේ දී වර්තමාන ලෝකයේ මාධ්‍ය ප්‍රවණතා පිළිබඳ අවබෝධය අත්‍යාවශ්‍ය වේ.

(i) විචාරශීලි ග්‍රාහකයෙක් සතුවිය යුතු කුසලතා **හතරක්** නම් කරන්න. **(ලකුණු 04යි.)**

(ii) ව්‍යාහාර හා භාවිතය මුල් කරගනිමින් ඇති වන මාධ්‍ය ප්‍රවණතා **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 08යි.)**

(iii) ලෝකයේ මාධ්‍ය නියාමනය සඳහා භාවිත කරන මූලික ප්‍රවේශ **තුනක්** පිළිබඳ විස්තර කරන්න. **(ලකුණු 12යි.)**

(iv) මාධ්‍ය අභිසාරිතාව නිසා ජනමාධ්‍ය හා එහි ග්‍රාහක ස්වභාවය වෙනස් වී ඇති ආකාරය කරුණු **හතරක්** ඔස්සේ විග්‍රහ කරන්න. **(ලකුණු 16යි.)**

05. ''නිර්මාණශීලීත්වය හා සන්නිවේදනය අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධතාවකි''.

(i) සන්නිවේදනයෙහිලා නිර්මාණශීලීත්වය උපයෝගී වන අවස්ථා **දෙකක්** කෙටියෙන් දක්වන්න. **(ලකුණු 04යි.)**

(ii) ප්‍රධාන චිත්‍රපට ප්‍රවර්ග **හතරක්** දක්වා ඉන් **එකක්** පිළිබඳ විස්තර කරන්න. **(ලකුණු 08යි.)**

(iii) සාම්ප්‍රදායික ජන සමාජය මහජන සම්බන්ධතාව පවත්වා ගැනීමට භාවිත කළ නිර්මාණාත්මක ක්‍රම **තුනක්** නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. **(ලකුණු 12යි.)**

(iv) (a) ඔබ පාසලේ නිල වෙබ් අඩවිය සැලසුම් කිරීමට ඔබ වෙත පැවරී ඇත. එහි මුල් පිටුව (Home Page) සඳහා ඇතුළත් කරනු ලබන කරුණු **හතරක්** සඳහන් කරන්න. **(ලකුණු 04යි.)**

(b) එම කරුණු ඔබ පාසලට විශේෂිතව යොදා ගැනීමේ වැදගත්කම පිළිබඳව සාකච්ඡා කරන්න. **(ලකුණු 12යි.)**

06. පාසල් නිවාසාන්තර මලල ක්‍රීඩා උළෙල උත්කර්ෂවත් කරගැනීමේ දී මහජන සම්බන්ධතා නිලධාරීන්, මාධ්‍ය නිලධාරීන් හා සිද්ධි කළමනාකරුවන්ගේ දායකත්වය අත්‍යවශ්‍ය බව විදුහල්පතිතුමා අවධාරණය කළේය.

(i) ආයතනයක් ලෙස පාසල සඳහා මහජන සම්බන්ධතාව අවශ්‍ය වන අවස්ථා **හතරක්** නම් කරන්න. **(ලකුණු 04යි.)**

(ii) මහජන සම්බන්ධතා නිලධාරියෙක් පාසල් ක්‍රීඩා උළෙලේ දී භාවිතයට ගත යුතු කුසලතා **දෙකක්** විස්තර කරන්න. **(ලකුණු 08යි.)**

(iii) ක්‍රීඩා උළෙල පිළිබඳ ප්‍රචාරණ කටයුතුවල දී මාධ්‍ය නිලධාරියා විසින් ඉටුකළ යුතු කාර්ය **තුනක්** නිදසුන් සහිතව පැහැදිලි කරන්න. **(ලකුණු 12යි.)**

(iv) ක්‍රීඩා උළෙලෙහි සිද්ධි කළමනාකරණයට අදාළ සැලැස්මෙහි පහත කරුණු පිළිබඳ පැහැදිලි කරන්න.

(a) ස්ථානය

(b) න්‍යාය පත්‍රය

(c) ආරාධිතයින් තීරණය කිරීම

(d) අවදානම් තක්සේරුව **(ලකුණු 16යි.)**

07. ජනමාධ්‍ය සංදේශ පිළිබඳ ජනතා අදහස් විමසමින් කටයුතු කිරීම සංවර්ධනය සඳහා සන්නිවේදනය යොදා ගැනීමේදී වැදගත් වේ.

(i) එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රකාශයට පත් කර ඇති අන්තර් සම්බන්ධිත සංවර්ධනය සඳහා වන සන්නිවේදන ප්‍රවේශ **හතරක්** නම් කරන්න. **(ලකුණු 04යි.)**

(ii) ජනප්‍රිය සංස්කෘතියේ ලක්ෂණ **දෙකක්** උදාහරණ සහිතව කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 08යි.)**

(iii) මාධ්‍ය නියාමනයට අදාළ ශ්‍රී ලාංකේය ආයතන **හතරක්** නම් කර ඉන් **දෙකක්** පිළිබඳ විස්තර කරන්න. **(ලකුණු 12යි.)**

(iv) ජනමාධ්‍යයන්හි වාර්තාවන ප්‍රචණ්ඩත්වය පිළිබඳ ග්‍රාහකයා තුළ පවත්නා ආකල්ප විමසා බැලීමේ සමීක්ෂණයක දී භාවිතයට ගතහැකි දත්ත රැස් කිරීමේ ක්‍රමවේද **දෙකක්** උදාහරණ සහිතව පැහැදිලි කරන්න. **(ලකුණු 16යි.)**

* * *